අරමුදල් කළමනාකරුගේ සමාලෝචනය

සාර්ව ආර්ථික තත්ත්වය

2023 වසරේ මුල් කාර්තුවෙහි ශ්‍රී ලංකා ආර්ථිකය පසුගිය වසරට සාපේක්ෂව 11.5% කින් හැකිළී ගියේ දශක ගණනාවකට පසු එහි දරුණුතම මූල්‍ය අර්බුදයෙන් රට තවමත් යථා තත්ත්වයට පත්වෙමින් සිටින නිසාවෙනි. කාර්මික අංශයේ සහ සේවා අංශයේ කාර්ය සාධනය පිළිවෙළින් 23.4**%** සහ 5**%** කින් පහත වැටුණු අතර කෘෂිකාර්මික අංශය 2023 වසරේ මුල් කාර්තුවෙහි 0.8**%** කින් පුළුල් විය. වෙළෙඳපොළ පොලී අනුපාත තිරසාර ලෙස අඩු කිරීමේ අපේක්ෂාවන් මධ්‍යයේ පුද්ගලික අංශයේ ණය වර්ධනය සහ පරිභෝජනය ඉහළ යාමත් සමඟ සංචාරක අංශයේ වේගවත් ප්‍රකෘතිමත් වීමක් දැකගත හැකි වූ අතර ඒ අනුව මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2023 දෙවන භාගයේදී දී පුළුල් වනු ඇතැයි අපේක්ෂා කළේය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි විධිවිධාන අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීම සඳහා මහ බැංකුව 2023 මාර්තු මාසයේදී සිය ප්‍රතිපත්ති අනුපාත පදනම් ඒකක 100 කින් වැඩි කළේය. කෙසේ වෙතත්**,** උද්ධමනය මනාව පාලනය කර ඇති හෙයින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කර ඇති අතර, 2023 වසර පුරාවට ද මහ බැංකුව සිය ලිහිල් කිරීමේ ස්ථාවරය අඛණ්ඩව කරගෙන යනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු. මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ස්ථාවරය වෙළෙඳපොළ පොලී අනුපාත අඩු කිරීමට සහ පුද්ගලික අංශයේ ණය වර්ධනයට ඉවහල් වනු ඇතැයි ද අප විශ්වාස කරන්නෙමු.

විදේශීය අංශය පසුගිය වසරට සාපේක්ෂව වැඩි කාර්ය සාධනයක් පෙන්නුම් කිරීම ආරම්භ කිරීමක් දැකගත හැකි විය. ආනයනවල සැලකිය යුතු අඩුවීමක් හේතුවෙන් 2023 පළමු භාගයෙහි වෙළෙඳ හිඟය කැපී පෙනෙන ලෙස අඩු විය. වසරේ මුල් භාගය තුළ සංචාරක ඉපැයීම් සහ සේවක ප්‍රේෂණ සැලකිය යුතු ලෙස වැඩිදියුණු වූ අතර ඉදිරි මාසවලදී තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2023 ජූනි මාසයේදී රාජයේ සුරැකුම්පත් වෙළෙඳපොළේ විදේශ ආයෝජන කැපී පෙනෙන ශුද්ධ ගලා ඒමක් වාර්තාවීම පෙන්නුම් කරන කළේය. ජූනි මස අවසන් වන විට චීන මහජන බැංකුවේ හුවමාරු පහසුකම ඇතුළුව දළ නිල සංචිත මට්ටම ඇමෙරිකානු ඩොලර් බිලියන 3.7ක් දක්වා ඉහළ යාමක් පෙන්නුම් කරන ලදි. එමෙන්ම 2023 වසරේ දෙවන කාර්තුව තුළදී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ලංකා රුපියලේ අගය ද ඉහළ ගියේය.

[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21] මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

පොලී අනුපාත පිළිබඳ ඉදිරි දැක්ම

උද්ධමන පීඩනය අවම කිරීම සඳහා ගනු ලැබූ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, 2023 වසරේ දෙවන භාගයෙහි උද්ධමනය මැදි තනි ඉලක්කම් මට්ටම් දක්වා පහත වැටෙනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු. උද්ධමනයෙහි කැපී පෙනෙන අඩුවීම්වලට සමගාමීව, ශ්‍රී ලංකා මහ බැංකුව වර්ධනය වේගවත් කිරීම සඳහා පහසුකම් සහිත මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට අපේක්ෂා කරයි. ඒ අනුව වෙළෙඳපොළ පොලී අනුපාත ද තීව්‍ර ලෙස පහත වැටීමක් සිදුවනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

<u>CTCLSA මුදල් වෙළෙඳපොළ අරමුදල (ආරම්භය: 2012 පෙබරවාරි 27)</u>

අරමුදල් කළමනාකරු

කුහන් විනායගසුන්දරම්

අරමුදල් අරමුණ සහ පදනම

අරමුදල දින 365ක් ඇතුළත කල් පිරෙන ආයෝජන ශ්‍රේණියේ සුරැකුම්පත් සඳහා ආයෝජනය කරන විවෘතාන්ත ඒකක භාර අරමුදලකි. අරමුදලේ ආයෝජන පරමාර්ථය වන්නේ අඩු අවදානම් මට්ටමේ සුරැකුම්පත් කළඹක ආයෝජනය කිරීමෙන් වාර්ෂික ආදායමක් ලබා දීමයි.

විවරණය

2023 වසරේ අවසන් මාස 6 තුළ CTCLSA මුදල් වෙළෙඳපොළ අරමුදල සිය ආයෝජකයින්ට 19.52% ක වාර්ෂික ප්‍රතිලාභයක් ලබා දී ඇත. අරමුදල මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ ආයෝජන ශ්‍රේණියේ සහ ඊට වැඩි නිකුත් කරන්නන් සමඟ ස්ථාවර තැන්පතු සහ අනෙකුත් මුදල් වෙළෙඳපොළ උපකරණ වෙත ය.

සටහන **01:** පදනම් ප්‍රතිලාභය සහ අරමුදල් ප්‍රතිලාභය[1]

කාලසීමාව		NDBIB-CRISIL දින 91 භාණ්ඩාගාර බිල්පත් දර්ශකය	GAMMF-වාර්ෂික
2023 පළමු කාර්තුව	9.68%	15.46%	19.52%

[1] මුදල් වෙළෙඳපොළ තොරතුරු පත්‍රිකාව
[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21] මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

ආරම්භයේ සිට	204.82%	189.52%	10.32%

**

**කාර්ය සාධනය 2023 ජූනි 28 වැනි දිනට මාසික අවසන් මිල ගණන් මත පදනම් වේ. මෙම ලේඛනයේ ඇතුළත් කාර්ය සාධන දත්ත අතීත කාර්ය සාධනය නියෝජනය කරන අතර අනාගත ප්‍රතිඵල පිළිබඳ සහතික කිරීමක් නොවන බව සළකන්න.*

ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා මහ බැංකුව ගෙන ඇති සුදුසු ක්‍රියාමාර්ග අනුව ඉදිරි කාලසීමාව තුළ වෙළෙඳපොළ පොලී අනුපාත තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපි විශ්වාස කරන අතර උද්ධමනය වසර මැද වන විට තනි ඉලක්කමක් දක්වා ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සැපයුම් තත්ත්වයන් වැඩිදියුණු කිරීම සහ ආනයන සීමා කිරීම් ක්‍රමානුකූලව ලිහිල් කිරීමත් සමඟ ව්‍යාපාර සහ ආයෝජකයින්ගේ සිත් තුළ වෙළෙඳපොළ පිළිබඳ විශ්වාසනීයත්වය වැඩිදියුණු වීම නිසා ආර්ථික වර්ධනය ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කරන අතර එම ප්‍රකෘතිමත්භාවය මධ්‍ය කාලීනව පවතිනු ඇතැයි ද අප අපේක්ෂා කරන්නෙමු.

අපගේ සාර්ව දැක්ම අනුව අප දිගු කාලීන ආයෝජන උපකරණවල ආයෝජනය කර ඇති අතර ද්‍රවශීලතාව ඉහළ මට්ටමක පවත්වා ගෙන යමින් කෙටි කාලසීමාවන් සඳහා කෙටිකාලීන ආයෝජන උපකරණවලද ආයෝජනය කර ඇත.

[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21]මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22]තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

අරමුදලේ මූලික තොරතුරු[2]

අරමුදලේ ණය ගුණත්වය - ශුද්ධ වත්කම් අගයෙහි ප්‍රතිශතයක් ලෙස



වත්කම් බෙදාහැරීම



2023 ජූනි 30 වන විට අරමුදලේ ඒකක හිමියන් සංඛ්‍යාව 402ක් සමඟ අරමුදලේ මුළු ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් මිලියන 551.36 කි. 2023 ජූනි 30 වැනි දින අරමුදල සඳහා දායකත්ව සහ මුදාගැනීමේ මිල රු. 26.4690 කි

කල් පිරීමේ සටහන - ශුද්ධ වත්කම් වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස

12 - 15



---

[2] මුදල් වෙළෙඳපොළ තොරතුරු පත්‍රිකාව
[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21] මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

2023 පළමු භාගයේ කොළඹ කොටස් වෙළෙඳපොළ කාර්යසාධනය

පිරිවැටුම



2023 පළමු මාස හය තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ සියළු කොටස් මිල දර්ශකය (ASPI) 11.23% ක වර්ධනයක් වාර්තා කළ අතර එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 කොටස් මිල දර්ශකය 2.96% කින් ඉහළ ගියේය. දේශීය ණය ප්‍රශස්තකරණය (DDO) පිළිබඳ වඩා හොඳ පැහැදිලි කිරීමක් සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළ එහි ධනාත්මක ස්ථාවරය දිගටම පවත්වාගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙතෙක් සිදු කරන ලද ප්‍රතිසංස්කරණ තුළින් න්‍යාය පත්‍රයේ සහයෝගය ද ඇතිව මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමක් අපේක්ෂා කරන අතර එය දිගුකාලීන වර්ධනයට ධනාත්මකව බලපානු ඇත. එපමණක් නොව, සාංගමික ඉපැයීම් 2023 හි දෙවන භාගයෙහි දී ප්‍රකෘතිමත් වනු ඇතැයි අප විශ්වාස කරන අතර වඩා හොඳ මෙහෙයුම් පරිසරයක් මගින් ඊට දායකත්වය සපයනු ලබයි. එය කොටස් තක්සේරු කිරීම් නැවත ඇගයීමට මගපාදනු ඇත. පොලී අනුපාත පහළට ගමන් කිරීමත් සමග ඉහළ ආදායමක් උපයා ගැනීම සඳහා ආයෝජකයින් කොටස් වෙළෙඳපොළ වෙත මාරුවීමක් සිදුවනු ඇතැයි අප විශ්වාස කරන අතර කොටස්වල ආයෝජනය බදු කාර්යක්ෂම වත්කම් පන්තියක් වීම දේශීය ආයෝජකයින්ට අමතර වාසියක් වනු ඇත.

[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

[21]මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023

[22]තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

CTCLSA වර්ධන හිමිකම් අරමුදල (ආරම්භය: 2012 පෙබරවාරි 27)

අරමුදල් කළමනාකරු:

කුහන් විනායගසුන්දරම්

අරමුදල් අරමුණ සහ පදනම:

වර්ධන හිමිකම් අරමුදල යනු මධ්‍යම හා දිගු කාලීන ප්‍රාග්ධන වටිනාකමක් ලබා ගැනීමේ අරමුණින් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත විවිධාංගීකරණය වූ කොටස්වල ආයෝජනය කරන විවෘතාන්ත වර්ධන අරමුදලකි.

<u>විවරණය</u>



[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21] මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

සටහන 02: අරමුදලේ ප්‍රතිලාභ සහ පදනම් ප්‍රතිලාභ

කාලය*	අරමුදල	පදනම ASPI	S&P SL 20	ASTRI
ගිණුම් වර්ෂය ආරම්භයේ සිට 2023 ජුනි දක්වා	**15.76%**	11.23%	2.96%	11.76%
ආරම්භයේ සිට සමස්ත එකතුව.	**112.94%**	72.42%	-8.19%	91.67%
ආරම්භයේ සිට වර්ධනය	**6.89%**	4.92%	-0.75%	5.91%

සටහන:
සියලු කොටස් මිල දර්ශකය (ASPI), සියලු කොටස් මුළු ප්‍රතිලාභ දර්ශකය (ASTRI) සහ S&P ශ්‍රී ලංකා 20 දර්ශකය (S&P SL 20) 2023 ජුනි 28 වන දිනට කොළඹ කොටස් හුවමාරුවේ දත්ත මත පදනම් වේ.

** කාර්ය සාධනය 2023 ජුනි 28 වැනි දිනට මාසය අවසන් මිල ගණන් මත පදනම් වේ. මෙම ලේඛනයේ ඇතුළත් කාර්ය සාධන දත්ත අතීත කාර්ය සාධනය නියෝජනය කරන අතර අනාගත ප්‍රතිඵල පිළිබඳ සහතිකයක් නොවේ.*

2023 ජුනි 30 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා අරමුදල 15.76% කින් ඉහළ ගිය අතර සියළු කොටස් මිල දර්ශකය (ASPI) සහ S&P SL 20 දර්ශකය පිළිවෙලින් 11.23% සහ 2.96% කින් වැඩි විය. ආරම්භයේ සිටම අරමුදල 112.94**%** ක ප්‍රතිලාභයක් ලබා ඇති අතර එය එම කාලසීමාව සඳහා වූ සියලු කොටස් මිල දර්ශකයේ කාර්ය සාධනය වන 72.42**%** ක අභිබවා ඇත.

[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21]මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22]තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

සටහන 08: 2023 ජූනි 30 වන විට අරමුදලේ හොඳම ආයෝජිත ආයතන 5

ශුද්ධ වත්කම් වටිනාකම අනුව හොඳම ආයෝජිත ආයතන 5		
කොටස් වර්ගය	සංකේතය	ශු.ව.ප්‍රතිශතය
සන්ෂයින් හෝල්ඩිංග්ස් පී එල් සී	SUN.N0000	**8%**
ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් පී එල් සී	JKH.N0000	**7%**
හේලීස් පී එල් සී	HAYL.N0000	**7%**
ඒ සී එල් කේබල්ස් පී එල් සී	ACL.N0000	**7%**
නෙස්ලේ ලංකා පී එල් සී	NEST.N0000	**7%**

සටහන 09: 2023 ජූනි 30 වන විට අරමුදල සඳහා එක් එක් අංශවලට අනුව වත්කම් වෙන්කිරීම



2023 පළමු කාර්තුව තුළ සාංගමික ඉපැයීම් පහළ ගිය අතර ඊට ප්‍රධානවම බලපාන ලද්දේ ඉහළ මූල්‍ය පිරිවැය, ආර්ථික අර්බුදය මධ්‍යයේ ව්‍යාපාරික පරිමාවන් සීමාවීම සහ ඉහළ පොලී අනුපාත මධ්‍යයේ කොටස් සඳහා ඇති දුර්වල ඉල්ලීම් තත්තවයන්ය. මෙහෙයුම් පරිසරය අනුව

[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21] මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

අරමුදල දිගුකාලීනව ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මූලික වශයෙන් ශක්තිමත් ආයෝජන උපකරණවල ආයෝජනය කර ඇත. අපගේ අවධානය යොමු වූයේ පොලී අනුපාත පහත වැටීමෙන් ප්‍රතිලාභ ලබන සමාගම් කෙරෙහි වන අතරම දේශීය පරිභෝජනය ප්‍රකෘතිමත් වීමත් සමඟ ඉහළ ප්‍රතිලාභයක් ලබා ගත හැකි පාරිභෝගික ද්‍රව්‍ය වෙත ආකර්ශනය වැඩිවිය.

තවදුරටත් මුදල් ප්‍රතිපත්ති අඩුකිරීමේ අපේක්ෂාව සමඟින්, ඉහළ සාංගමික ඉපැයීම් සඳහා සහාය වෙමින් ඉදිරි කාලපරිච්ඡේදය තුළ පොලී අනුපාත තවදුරටත් පහත වැටෙනු ඇතැයි අප අපේක්ෂා කරන්නෙමු. එබැවින්, සමාලෝචිත කාලපරිච්ඡේදයේ අවසාන භාගයේදී, අපි ප්‍රාග්ධන භාණ්ඩ, බැංකු, විවිධාංගීකරණය වූ මූල්‍ය සේවා අංශය සහ සංචාරක ක්ෂේත්‍රවලට අවධානය වැඩි කළෙමු. යෝජිත දේශීය ණය ප්‍රශස්තකරන වැඩපිළිවෙළින් පසු අංශයට ඇති කරන අවම බලපෑම හේතුවෙන් නුදුරු අනාගතයේදී බැංකු අංශයේ තියුණු ප්‍රති ශ්‍රේණිගත කිරීමක් අප අපේක්ෂා කරන්නෙමු. කොටස් පිළිබඳ අපගේ උද්යෝගිමත් අදහස් අනුව අප වත්කම් වෙන් කිරීම් 80% ට වඩා තබා ගැනීමට ද තීරණය කරන්නෙමු.

තවදුරටත් මූල්‍ය ප්‍රතිපත්ති අඩු කිරීමේ අපේක්ෂාව සමඟ, ඉහළ සාංගමික ඉපැයීම් සඳහා සහාය වෙමින් ඉදිරි කාලසීමාව තුළ පොලී අනුපාත තවදුරටත් පහත වැටෙනු ඇතැයි අප අපේක්ෂා කරන්නෙමු. එබැවින්, සමාලෝචිත කාලපරිච්ඡේදයේ අවසාන භාගයේදී, අප විසින් ප්‍රාග්ධන භාණ්ඩ, බැංකු, විවිධාංගීකරණය වූ මූල්‍ය සේවා අංශය සහ සංචාරක ක්ෂේත්‍රවලට අවධානය වැඩි කළෙමු. යෝජිත දේශීය ණය ප්‍රශස්තකරණ වැඩපිළිවෙලින් පසු බැංකු අංශයට ඇති කරන අවම බලපෑම හේතුවෙන් නුදුරු අනාගතයේදී බැංකු අංශයේ තියුණු ප්‍රති ශ්‍රේණිගත කිරීමක් අපි අපේක්ෂා කරමු. කොටස් පිළිබඳ අපගේ උද්යෝගිමත් අදහස් අනුව අපි වත්කම් වෙන් කිරීම් 80% ට වඩා තබා ගැනීමට තීරණය කරමු

2023 ජූනි 30 වන විට, අරමුදලේ ඒකක හිමියන් 235ක් සමඟින් අරමුදලේ මුළු ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් මිලියන 78.16ක් විය. 2023 ජූනි 30 වැනි දින වන විට අරමුදල සඳහා නිදහස් කිරීමේ මිල රු. 21.2966

CTCLSA ආදායම් අරමුදල (ආරම්භය: 2021 ජූලි 26)

[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21] මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

අරමුදල් කළමනාකරු

කුෂාන් විනයාගසුන්දරම්

අරමුදල් අරමුණ සහ පදනම

CTCLSA ආදායම් අරමුදලේ ආයෝජන අරමුණ වන්නේ මධ්‍යස්ථ අවදානම් සහිත ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීමෙන් වාර්ෂික ආදායමක් ලබා දීමයි. අරමුදලේ අවදානම් සහ ප්‍රතිලාභ අවශ්‍යතා සලකා බලා ඒකක හිමියන්ට සුදුසු ප්‍රතිලාභයක් ලබා දීම සඳහා අරමුදල සාංගමික ණය සහ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලබයි.

විවරණය

2023 වසරෙන් අවසන් වූ මාස 6 තුළ, CTCLSA ආදායම් අරමුදල එහි ආයෝජකයින්ට 23.69% ක වාර්ෂික ප්‍රතිලාභයක් ලබා දී ඇත. අරමුදල මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ ආයෝජන ශ්‍රේණිගත කිරීම් සහ ඊට වැඩි නිකුත් කරන්නන් සමඟ රජයේ සුරැකුම්පත් සහ අනෙකුත් ස්ථාවර ආදායම් උපකරණ කෙරෙහි ය.

සටහන 03: පදනම් ප්‍රතිලාභයට මත අරමුදලේ ප්‍රතිලාභය[3]

කාලය	GAIF	NDBIB-CRISIL දින 364 භාණ්ඩාගාර බිල්පත් දර්ශකය	GAIF-වාර්ෂික
2023 ජුනි	1.97%	5.92%	24.00%
2023 වර්ෂය ආරම්භයේ සිට	11.75%	21.13%	23.69%

කාර්ය සාධනය 2023 ජූනි 30 වැනි දිනට මාසයෙහි අවසන් මිල ගණන් මත පදනම් වේ. මෙම ලේඛනයේ ඇතුළත් කාර්ය සාධන දත්ත අතීත කාර්ය සාධනය නියෝජනය කරන අතර අනාගත ප්‍රතිඵල පිළිබඳ සහතිකයක් නොවේ.

[3] තොරතුරු පත්‍රිකාව – ආදායම් අරමුදල
[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21] මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

අරමුදලේ මූලික තොරතුරු[4]

අරමුදලේ ණය ගුණාත්වය - ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක්



වත්කම් බෙදා හැරීම



2023 ජුනි 30 වන විට අරමුදලේ මුළු ශුද්ධ වත්කම් වටිනාකම රු. අරමුදලේ ඒකක හිමියන් 55ක් සමඟ රුපියල් මිලියන 98.45ක්. 2023 ජුනි 30 වැනි දින අරමුදල සඳහා දායකත්ව සහ මුදාගැනීමේ මිල රු. 12. 8174

කල් පිරීමේ කාලය - ශුද්ධ වත්කම්වල

---

[4] Fact Sheet – Income Fund

[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල

[21] මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023

[22] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල



ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා මහ බැංකුව ගෙන ඇති සුදුසු ක්‍රියාමාර්ග අනුව ඉදිරි කාලසීමාව තුළ වෙළෙඳපොළ පොලී අනුපාත තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපි විශ්වාස කරන අතර උද්ධමනය මධ්‍ය කාලීනව මධ්‍යම තනි මට්ටම්වලින් ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සැපයුම් තත්ත්වයන් වැඩිදියුණු කිරීම සහ ආනයන සීමා කිරීම් ක්‍රමානුකූලව ලිහිල් කිරීම සමඟ ව්‍යාපාර සහ ආයෝජකයින්ගේ මනෝභාවය වැඩිදියුණු වන අතර එමඟින් ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කෙරේ. ප්‍රකෘතිය මධ්‍ය කාලීනව පවතිනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

අපගේ සාර්ව දැක්ම අනුව, පොලී අනුපාත පහත වැටෙන විට ලාභ ප්‍රාග්ධන ලාභය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් පවතින රාජ්‍ය සුරැකුම්පත් තබා ගනිමින් අරමුදල් අස්වැන්න ඉහළ නැංවීම සඳහා අපි අරමුදල සමඟ දිගු කාලීන උපකරණ සඳහා ආයෝජනය කළෙමු.

[19] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[20] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල
[21] මෙහෙයුම් ප්‍රකාශය – 28.06.2023
[22] තොරතුරු පත්‍රිකාව – හිමිකම් අරමුදල